2017 අගෝස්තු

67 වැනි කලාපය

ශ්‍රීලංකා හේතුවාදී සංගමයේ

ප්‍රකාශනයකි

මිල රුපියල් 40.00

# යථාර්ථ

**"*YATHARTHA*"**

පුවත් ලිපිය - **NEWS LETTER**

---

## විද්‍යාව "බටහිර" ද ? "පෙරදිග" ද ?

ලංකාවේ සිංහල ජාතිකවාදී උගතුන් අතර තිබෙන එක ජනප්‍රිය ප්‍රවාදයක් වන්නේ විද්‍යාව යන දැනුම් පද්ධතිය බටහිර-යුදෙව්-ක්‍රිස්තියානි සංස්කෘතික මූලයකින්/චින්තන කවුළුවකින් බිහිවී (ලෝකයේ ආධිපත්‍යය අත්කරගත්) වර්ධනය වුවක්ය යන්න. එපමණකින් නතර නොවන සමහර න්‍යායාචාර්ය වරු පවසන්නේ මේ විද්‍යාව යනු පට්ටපල් බොරුවක් බවයි. මේ මතවාදයේ අනුගාමිකයෝ ඒ අනුව කෙතරම් මුග්ධ විනිශ්චයන් කරා එළඹෙන්නේද යත් මීට වසර කිහිපයකට පෙරාතුව අපේ රටේ මහත් ආන්දෝලනාත්මක පුවතක් වූ බුදු පිළිම වලින් "රැස් විහිදීම" යන්න පැහැදිලි කළේ, එය මිත්‍යාවක් වන්නේ "බටහිර විද්‍යාවට" අනුව විග්‍රහ කිරීමට කළ උත්සාහය තුල බවයි. [එනම් ඔවුනට අනුව පෙරදිග සංස්කෘතික සම්ප්‍රදාය තුල වර්ධනය වූ "විද්‍යාවක්" තිබුනිනම් බුදු පිළිම වලින් බුදුරැස් විහිදීම යතාර්ථයක් විය යුතුය.] එවකට පුවත්පත් වල මෙවැනි ආකාරයේ ලිපි පළවුණි. ඇත්තෙන්ම එම ආලෝක විද්‍යා (ප්‍රකාශ විද්‍යා) සංසිද්ධිය යනු පැහැදිලි කිරීමට විද්‍යාවක් අවශ්‍ය නොවන තරම් සරල සංසිද්ධියකි. මෙකී බුදුරැස් විහිදීම යනු දෘශ්‍ය මායාවකි (Optical illusion). දිදුලන පැහැදිලි වර්ණ දෙකක් මායිම් වන රේඛාව ඔස්සේ එසේ පෙනෙන්නට වීම ස්වභාවික මායාවකි හෙවත් අපේ ඇස රැවටීමකි. රත්වූ පෘෂ්ඨයක් ආසන්නයේ ඇති වාතය රත්වී ඉහල නැගීම හේතුවෙන් වර්තනය වන ආලෝක කිරණ නිසා අපට "පෙනෙන" මිරිඟුව යනු තවත් එවැනි වූ දෘශ්‍ය මායාවකි. ඇත්තෙන්ම ද්වි වර්ණාලේපිත බුදු පිළිමයක් හෝ වෙනත් ආගමික ශාස්තෘ වරයෙකුගේ ප්‍රතිමාවක් හෝ එපමණක් නොව හුදෙක් එලෙස දීප්තිමත් වර්ණ දෙකක් සහිත කඩසියක් මතුපිට පවා එම වර්ණ මායිම් වන/ඡේදනය වන සීමා රේඛාව ඔස්සේ "බුදුරැස්" දැක ගැනීමේ හැකියාව ඕනෑම බැතිමතෙකුට ඇත. [අද පවා ඕනෑම කෙනෙකුට මෙම කාරණය නිරීක්ෂණය කොට ප්‍රත්‍යක්ෂ කරගත හැකිය.] එවිට කඩදාසියකින් රැස් විහිදීම පැහැදිලි කරන්නාවූ බටහිර නොවන තවත් විද්‍යාවක් සොයා ගැනීමට සිදුවනු ඇත.

මෙම පූර්විකාව ඔස්සේ යලි උක්ත තේමාව එනම් බටහිර විද්‍යාවට වෙනස්වූ පෙරදිග විද්‍යාවක් එසේනැත්නම් බෞද්ධ විද්‍යාවක් හෝ සිංහල විද්‍යාවක් වෙත්ද යන ප්‍රශ්නය හා බැඳුනු ප්‍රවාදය සාකච්ඡාවට ගැනීමට හැකිය.

විද්‍යාත්මක දැනුමට හා නුතන දැනුමට එරෙහි මේ අයගෙන් අපට ඇසීමට ඇති පළමු සරල පැනය වන්නේ මේ වනවිටත් (සියවස් දෙක තුනක් තුල) මේ “බටහිර දැනුම හා විද්‍යාව” විසින් නූතනයේ සෑම ක්ෂේත්‍රයක් තුලම පාහේ අත්පත් කරගෙන ඇති වර්ධනය නිසා සමාජයට, මිනිස් වර්ගයාට මතුද නොව අවදානමට ලක්වන ස්වභාව ධර්මයාට පවා අත්කර දී ඇති ජයග්‍රහණ වල උරුමය “බටහිර විද්‍යාවට” හෝ එහි චින්තන පදනමට බැර කළ යුතුද යන්න. අද අප භාවිත කරන නූතන තාක්ෂණික උපකරණ වල සිට මුලිනුපුටා දැමූ පුරාන වසංගත රෝග වැනි දේ මෙන්ම ක්‍රමානුකූලව ඉහළ ගිය මානවයාගේ අපේක්ෂිත ආයුකාලය වැනි දේ ද, වේගවත් ප්‍රවාහන මාදිලි, විවිධාංගී කරණය වී ඇති විනෝදාස්වාදය ආදිය ඇතුලු සමස්තය අපට ලබා දී ඇත්තේ මෙකී “යුදෙව්-ක්‍රිස්තියානි-බටහිර දැනුමේ” වර්ධනය විසින්ද ? එවැන්නක් භාරගැනීම යනු අපට අනුව නම් ආගමික සන්දර්භයකට කෙසේවත් උරුම කරදිය නොහැකි/සුදුසුකම් නොලත් ව්‍යාජ ගෞරවනීයත්වයක් බලෙන් පැටවීමකි.

අපි විසින් මහත් උත්කර්ෂයට නංවන අපේ ඉපැරණි දැනුම තුලින් නිමවූ අනගි නිර්මාණයක් වන දැදිගම අලි පහන (ඇත්පහන) වැනි දේ විග්‍රහ කිරීමට/එම දැනුම අගය කිරීමට භාවිත කරනුයේ අර කී බටහිර විද්‍යාවේ ද්‍රව-ගති විද්‍යාව (Fluid Dynamics) ය.

දැනුම බිහිවීමට හා දැනුම සංවර්ධනයට ඒ සමාජයේ සංස්කෘතික පරිකල්පනය දායක වෙයි. නූතන දැනුම ගොඩනැගීමට ඉවහල්වූ කඩදාසි නිෂ්පාදනය, මුද්‍රණ තාක්‍ෂණය මෙන්ම වෙඩිබෙහෙත් ද මුලින්ම සොයාගත්තේ චීනුන් විසින් බව පොදු වශයෙන් පිළිගැනේ. ගණිතය වර්ධනය වුයේ ඉන්දියාවේ, අරාබියේ බවද පැවසේ. ලංකාවේ වාරි තාක්‍ෂණයද දියුණු මට්ටමක පැවතුනි. ඉරාකයේ බැග්ඩෑඩ්හි (අතීතයේ මෙසපොතේමියාවේ) දී සොයාගත් ඉපැරණිම විද්‍යුත් කෝෂය හෙවත් බැටරිය විද්‍යාවට එකතු වූ තවත් දැනුමකි. නගර නිර්මාණය/වාස්තු විද්‍යාව ග්‍රීසියේ, ඊජිප්තුවේ හා චීනය (මතුද නොව කාම්බෝජය) ආශ්‍රිතව දැක ගත හැකිය. දකුණු අමෙරිකාවේදීද ශිෂ්ටාචාරමය වශයෙන් වැදගත් වර්ධනයන් පිළිබඳව තොරතුරු පවසන නෂ්ඨාවශේෂ ඉතිරිව ඇත. එනිසා විද්‍යාව හා දැනුම බිහිවුයේ හා වර්ධනය වුයේ බටහිර ය යන්නද ව්‍යාජයකි. අනෙක් අතට විද්‍යාවේ පොල්මක්කාර අයිතිය අප සතුය; එහි පේටන්ට් අයිතිය අප සතුය කියා (ලංකාවේ මෙන් ගුරුමුෂ්ටියක් ලෙස) සෙසු ලෝකයාගෙන් වහන්කොට තබා ගත්තේ ද නැත.

තවද ඒ දැනුම හුදෙක් යුදෙව්-ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට ගොදුරු වූ බවද පිළිගත නොහැක. අතීතයේ ආක්‍රමණයන්, ව්‍යාප්තවාදයන් හා යටපත් කිරීම් වූ මුත් නූතන දැනුම හා විද්‍යාවට පළමුව සටන් කිරීමට සිදුවුයේ බටහිර ක්‍රිස්තියානි ආගමික ආධිපත්‍යයට එරෙහිව වීමද බැහැර කළ නොහැකි ඉතිහාසගත සාක්ෂියකි.

එමෙන්ම අද තාක්ෂණික වර්ධනයේ කේන්ද්‍රය යුරෝපය යැයි තර්ක කළ හැකි නොවේ. තාක්‍ෂණික කේන්ද්‍රය ලෝක ගෝලය සිසාරා වෙනස් වනු ඇත.

*තාරක වරාපිටිය*

# අභියෝග සහ බහුභූත

*[ආචාර්ය නලින් ද සිල්වා මහතා සමග වන සංවාදයකදී විදුසර සඟරාවේ පළවූ ලිපියකි.]*

පසුගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ සිට විදුසර සඟරාව මගින් නලින් මහතාට මා කළ අභියෝග එකකට වත් තවමත් පිළිතුරු දී නැත

මේ වාදයට දැන් නව මාසයක් පමණ කල් ගොස් ඇති බැවින් මෙතෙක් කල් මා කළ අභියෝග සහ නලින් මහතා ඒවාට දී ඇති පිළිතුරු සංක්ෂිප්තව ආවර්ජනය කිරීමට කාලය පැමිණ ඇත. මා නැඟූ ප්‍රශ්න සහ ඔහු සැපයූ පිළිතුරු පහත දැක්වේ.

**1 වැනි අභියෝගය-** *නවීන විද්‍යාව පට්ටපල් බොරුවක් බව ඔප්පු කරන්න.* මෙය ඔප්පු කල යුත්තේ විද්‍යාව භාවිතා කොට නො ව වෙන ක්‍රමවේදයක් භාවිත කොට විය යුතු ය. විද්‍යාව බොරුවක් බව ඔප්පු කරන්නට විද්‍යාව භාවිත කළ හැකි නො වේ.

නලින් මහතා මීට පිළිතුරු වශයෙන් සඳහන් කළේ විද්‍යාවේ එන නොයෙකුත් සංකල්ප ඉන්ද්‍රිය ගෝචර නො වන නිසා එම සංකල්ප බොරු බව ය. තව ද ඒ මහතා කියන්නේ බුදුදහමේ ද්වියතානුපස්සනා සූත්‍රයට අනුව සැම නාම රූපයක් ම මුසාවක් බවයි. එම නිසා ඉන්ද්‍රිය ගෝචර සාක්ෂි වුව ද මුසාවක් වන්නේ ය. එම නිසා ඉන්ද්‍රිය ගෝචර වුවත් නො වුවත් ලෝකයේ ක්‍රියාදාමයන් සියල්ල නලින් මහතාට අනුව බොරු ය.

මීට පිළිතුරු වශයෙන් මා කියා සිටියේ ඉන්ද්‍රිය ගෝචර නො වන ස්වභාවධර්මයේ ඇති නොයෙකුත් ක්‍රියාදාමයන් භාවිත කර ඒවායින් ප්‍රයෝජන ගැනීමේ දී මේ සංකල්ප භාවිත කිරීම අනිවාර්ය වන බව ය. උදාහරණ වශයෙන් මා ඉදිරිපත් කළේ ගුරුත්වාකර්ෂණය, විදුලිය, විද්‍යුත් චුම්බක කෙෂත්‍ර වූයේය. විදුලිය ඉන්ද්‍රිය ගෝචර නොවන්නේ ය. එහෙත් විදුලිය කියා දෙයක් නැතැයි කිව හැකි ද?

අවසානයේ නලින් මහතා විද්‍යාව පට්ටපල් බොරුවක් බව ඔප්පු කරන්නේ බුදු දහමේ ද්වියතානුපස්සනා සූත්‍රයේ පිහිටෙනි. එම සූත්‍රය පවසන්නේ සැම නාම රූපයක් ම මුසාවක් බව ය. නලින් මහතාට මේ සූත්‍රය දියේ ගිලෙන මිනිසාට පිදුරු ගහක් මෙන් ය. අන් කිසි ම ක්‍රමයකින් විද්‍යාව බොරු බව ඔප්පු කරගන්නට බැරි වූ නිසා ඔහු ද්වයතානුපස්සනා සූත්‍රයේ එල්ලී දියෙන් ගොඩ එන්නට බලයි. නලින් මහතා ද්වයතානුපස්සනා සූත්‍රය මෙලෙස වැරදි විදියට පාවිච්චි කරන විට බුදුදහමේ හදවත බඳු පටිච්චසමුප්පාදය ඔහුට අතහැර දමන්නට සිදු වේ. බුදුන් සැම දෙයක ම පැවැත්ම ගැන ඉතා පැහැදිලිව පවසා ඇති පටිච්චසමුප්පාදය නලින් මහතා නො සලකා හරින්නේ තමා ගේ වාසියට ය. බුදුරදුන් කච්චයානගොත්ත සූත්‍රයේ ඉතා ම පැහැදිලිව පවසන්නේ සැම දෙයක් ම පවතී යන්න එක් අන්තයක් බවය. එසේ ම සැම දෙයක් ම නොපවතී යන්න

අනෙක් අන්තය බව ය. උන්වහන්සේ තොරාගන්නේ මධ්‍යම පිළිවෙතක් බවය. මින් අදහස් වන්නේ සැම දෙයක් ම නිත්‍ය වශයෙන් පවතින්නේ වත් නිත්‍ය වශයෙන් නො පවතින්නේ වත් නැත යන අනිත්‍ය ධර්මතාව වන්නේ ය. මෙය දේශනා කොට අනතුරුව බුදුහු එම අවස්ථාවේම පටිච්චසමුප්පාදය දේශනා කළ සේක. අනිත්‍ය ධර්මය දේශනා කොට එය සිදු වන අන්දම පහදා දීමට බුදුදහමේ වැදගත්ම සංකල්පය වන පටිච්චසමුප්පාදය වදාළහ. නලින් මහතා ද්වයතානුපස්සනා සූත්‍රය තේරුම් නොගෙන ඊට වෙන අරුතක් දෙනවිට එය පටිච්චසමුප්පාදය සමග එකඟ නොවන නිසා ඔහු කරන්නේ පටිච්චසමුප්පාදය විකෘති කිරීම ය.

එම විකෘති කිරීම මෙසේය. පටිච්චසමුප්පාදය ලෝකය ගැනවත් එහි තුළ ඇති වස්තූන් ගැන වත් කිසිවක් නොකියන බව නලින් මහතා පවසයි. එම දහමේ ජාති, ජරා, මරණ යන වචන ඔහුට වැදගත් නැත. ඒ වචනවලින් අදහස් වන්නේ බුදුන් සඳහන් කළ අනිත්‍ය වූ සැම දෙයක්ම එනම් ලෝකය සහ වස්තූන් ඉපදී වෙනස් වී නැති වන බව ය. පටිච්චසමුප්පාදය ලෝකය සහ එහි ඇති වස්තූන් පිළිබඳව කිසිවක් කියන්නේ නැතිනම් එය කියන්නේ කුමක් ගැන ද? මිනිසා හඳට පා තැබූ වග නලින් මහාතාගේ ද්වයාතානුපස්සනා සූත්‍රයට අනුව මුසාවකි. නලින් මහතා එම සූත්‍රය තේරුම්ගෙන නැති බව ඉන් පැහැදිලි වන්නේය. කච්චයානගොත්ත සූත්‍රයට අනුව හඳ ද, නීල් ආම්ස්ට්‍රොන්ග් ද, හඳට ගිය රොකට්ටුවද යන සැම දෙයක් ම අනිත්‍ය වූ ධර්මතාවට යටත් වන්නේ ය. ඒවා ඇතිවී වෙනස්වී නැති වන්නේ ය. අද ලෝකයේ ජීවත් වන ජීවත් විය යුතු අප විශ්වාස කළ යුත්තේ කුමක් ද යන්න මෙතැනදී ඉතාම පැහැදිලි ය. හඳ වැනි වස්තූන් ඇතිවී, වෙනස්වී, නැතිවී යන බව විද්‍යාව විසින් ද සොයාගනු ලැබ ඇත. අනිත්‍ය වූ ධර්මතාව විද්‍යාව විසින් ද තහවුරු කෙරෙන බව කිව හැකි ය.

බුදුන් මුසාව යන වචනයද ශුන්‍ය යන වචන ද භාවිත කොට ඇත්තේ ලෝකයේත් එහි තුළ ඇති වස්තූන්වලත් ආත්මීය හෝ ස්වභාව හෝ වැනි ගුණයක් නොමැති බව පෙන්වා දීමට ය. මේ වස්තූන් කෙරෙහි ඇල්මක් ඇති කරගැනීමේ තිබෙන මුළාව සහ එහි ආදිනව පැහැදිලි කර දීමට බුදුන් මේ වචන භාවිත කොට ඇත. මේ බව වටහා නො ගෙන නලින් මහතා පිදුරු ගහේ එල්ලී විද්‍යාව පට්ටපල් බොරුවක් බව ඔප්පු කිරීමට ද්වයාතානුපස්සනා සූත්‍රයේ පිහිට පතයි. ඔහුට අනුකම්පා කිරීම මිස වෙන කුමක් කරන්න ද?

විද්‍යාව පට්ටපල් බොරුවක් බව ඔප්පු කරන්නට ඔහුට වෙන ක්‍රමයක් නැද්ද? මිනිසා හඳට පා තැබුවේ නැතැයි කියා ඔප්පු කරන්නට ඔහුට බැරි ද? අහස් යානා අහසේ පියාසර නො කරන බව ඔප්පු කරන්නට ඔහුට බැරි ද? අහස් යානා බිමට කඩා වැටෙන්නේ නැති බව ඔහුට ඔප්පු කරන්නට බැරි ද? මෙවැනි ප්‍රශ්න අසන විට ඔහු කියන්නේ මා පොඩි ළමයකු මෙන් ප්‍රශ්න අසන බව ය. එවැනි ප්‍රශ්න අසන්නට සිදු වී ඇත්තේ නලින් මහතා පොඩි ළමයකු මෙන් විද්‍යාව පට්ටපල් බොරුවක් බව පවසා එය ඔප්පු කරගන්නට බැරි ව පිදුරු ගස්වල එල්ලෙන නිසා ය.

**2 වැනි අභියෝගය-** *විද්වත් අයින්ස්ටයින් විද්වත් නිව්ටන් ගේ න්‍යාය බොරු කළේ නම් අද වුවත්*

හඳට යැම සඳහා එම න්‍යාය භාවිත වන්නේ කෙසේ ද? මේ ප්‍රශ්නයට නලින් මහතා පිළිතුරක් දී නැත. නලින් මහතා නිව්ටන්ගේ න්‍යාය මත අයින්ස්ටයින්ගේ මතවාද බලපාන්නේ කෙසේ ද යන්න ගැන හාන්කවිසියක දැනුමක් ලබාගෙන නැත. අයින්ස්ටයින් ගේ න්‍යාය ආලෝකයේ වේගය ඇතුළුව ඕනෑ ම වේගයකින් චලනය වන වස්තුවකට අදාළ වන්නේ ය. නිව්ටන් ගේ න්‍යාය ආලෝකයේ වේගය හෝ ඊට කිට්ටු වේගයකින් චලනය වන වස්තුවක් සඳහා භාවිත කළ නොහැකි ය. හඳට යන රොකට්ටුවක් ආලෝකයේ වේගයට වඩා බොහෝ සෙයින් අඩු වේගයකින් ගමන් කරයි. ආලෝකයේ වේගය තත්පරයට මීටර් 299792458ක් වන්නේ ය. අභ්‍යවකාශ රොකට්ටුවක් පෘථිවියේ ගුරුත්වාකර්ෂණ බලයෙන් මිදෙන්නට නම් එහි වේගය තත්පරයට මීටර් 7900ක් පමණ විය යුතු ය. මේ වේග දෙක අතර ඇත්තේ විශාල වෙනසකි. රොකට්ටුවේ වේගය වැනි අඩු වේගයකින් ගමන් ගන්නා වස්තුවක් සම්බන්ධයෙන් නිව්ටන් ගේ න්‍යාය සහ අයින්ස්ටයින් ගේ න්‍යාය භාවිත කොට ලබාගන්නා ගණිතමය නිගමන අතර ඇති වෙනස අල්ප වන්නේ ය. නොසලකා සිටිය හැකි තරමට අල්ප වන්නේය. මේ නිසාය අඩු වේගයකින් ගමන් ගන්නා වස්තු සඳහා නිව්ටන් ගේ න්‍යාය භාවිත කළ හැක්කේ. ආලෝකයේ වේගයට සමාන වේගයකින් ගමන් ගන්නා වස්තූන් (උදා- ඉලෙක්ට්‍රෝන) හෝ අධි ගුරුත්වාකර්ෂණ ක්ෂෙත්‍ර තුළ ගමන් ගන්නා වස්තූන් සඳහා හෝ නිව්ටන්ගේ න්‍යාය භාවිත කළ නොහැකි බව පෙන්වා දී ඇත.

**3 වැනි අභියෝගය-** විද්වත් අයින්ස්ටයින්ගේ සාමාන්‍ය (සාධාරණ) සාපේක්ෂතාවාදය නිර්මාණය කර ඇත්තේ ඔහුගේ විශේෂ සාපේක්ෂතාවාදය සහ නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණය පිළිබඳ න්‍යාය ආවරණය වන පරිදි ය. මෙය වැරැදි බව නලින් මහතා පවසා ඇත. එය වැරැදි බව ඔප්පු කරන මෙන් මා කළ අභියෝගයට පිළිතුරු නැත.

නලින් මහතා විශේෂ සාපේක්ෂතාවාදයේ විශේෂ යන වචනයේ වැදගත්කම සහ එහි අරුත දන්නේ නැත. මා මේ බව මගේ පෙර ලිපියකින් පෙන්වා දී ඇත. මෙහි විශේෂ යන්නෙන් අදහස් වන්නේ විශේෂ සාපේක්ෂතාවාදය අදාළ වන්නේ අවස්තිත සමුද්දේශ රාමුවලට පමණක් බව ය. වෙනත් සමුද්දේශ රාමුවලට එම මතවාදය අදාළ වන්නේ නැත. වැඩි හෝ අඩු නොවන වේගයකින් වෙනස් නොවන දිශාවකට ගමන් ගන්නා සමුද්දේශ රාමු සඳහා අදාළ මතවාදය හැඳිනගැනීම පිණිස විශේෂ සාපේක්ෂතාවාදය යන නම යොදන්නේ එය විශේෂ සිදුවීමක් පිළිබඳ වූ මතවාදයක් වන නිසා ය. මා මේ බව පැවසූ විට නලින් මහතා මේ පිළිබඳව පවසා තිබුණේ සාපේක්ෂතාවාදය රඳා පවතින්නේ සමුද්දේශ රාමු මත හෙයින් එහි විශේෂත්වයක් නැත කියාය. මින් පෙන්නුම් වන්නේ අයින්ස්ටයින් ගේ සාපේක්ෂතාවාද දෙක වෙන් කොට හැඳින ගැනීමට යොදා ඇති විශේෂ සහ සාමාන්‍ය (සාධාරණ) යන වචන දෙකේ විෂයයට අදාළ වැදගත්කම සහ අරුත පිළිබඳව මෙලෝ හසරක දැනුමක් නලින් මහතාට නැති බවය. මෙය නොදැන අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදය අවබෝධ කොටගත නොහැකිය. මේ බව නලින් මහතා තේරුම් ගෙන නැති බව මගේ "නලින් ද සිල්වා මහතා සාපේක්ෂතාවාදය වත් වටහා ගෙන නැත" යන ලිපියෙන් (විදුසර-25.08.14) පැහැදිලි කොට දී ඇත. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ඉගැන්වූ

තමාගේම විෂයයක් වූ සාපේක්ෂතාවාදය පිළිබඳව මූලික වූ දැනුමක් නලින් මහතාට නැත්නම් වෙන දේ ගැන කියනුම කවරේ ද?

සාමාන්‍ය (සාධාරණ) සාපේක්ෂතාවාදය පිළිබඳව ඔහු පවසන්නේ කිසිම වැදගත්කමක් නැති දෙයකි. ඔහු කියන්නේ සාමාන්‍ය යන වචනය මේ සඳහා සුදුසු නැති බවය. සාමාන්‍ය යන වචනය ද සාධාරණ යන වචනයද මේ දෙකම ද විද්‍යාව ගැන ලියන විද්‍යාඥයන් සහ ලිපි ලියන්නන් පාවිච්චි කරන බව මා උදාහරණ සමග පෙන්වා දී ඇත. ප්‍රශ්නයේ වැදගත් නැති දෙයක එල්බී ප්‍රශ්නයෙන් පැන යන්නට නලින් මහතා අති දක්ෂයෙකි.

**4 වැනි අභියෝගය-**
සාමාන්‍ය (සාධාරණ) සාපේක්ෂාතාවාදය තුළ ගුරුත්වාකර්ෂණය නැති බව නලින් මහතා පවසා ඇත. ඒ බව ඔහු ඔප්පු කොට නැත. ඒ බව ඔප්පු කර ඇති විද්‍යාඥයකු ඇතොත් පෙන්වා දෙන මෙන් කළ අභියෝගයට පිළිතුරු නැත. සාමාන්‍ය (සාධාරණ) සාපේක්ෂතාවාදය විසින් ගුරුත්වාකර්ෂණයද ආවරණය කරන බවට මා ඕනෑ තරම් සාක්ෂි සහ ලිපි ලේඛනවල නිර්දේශ ඉදිරිපත් කළ විට ඔහු කියන්නේ පොත්පත්වල තිබූ පලියට අප ඒවා පිළිගත යුතු නැති බවය. මා පිළිගන්නේ සාක්ෂි ඇතොත් පමණි. කවුරුන්හෝ කුමක්හෝ කී පලියට මා එය පිළිගන්නේ නැත. සාමාන්‍ය (සාධාරණ) සාපේක්ෂතාවාදය ගුරුත්වාකර්ෂණයද ආවරණය කරන්නේ නැති බවට කිසි ම සාක්ෂියක් නලින් මහතා ඉදිරිපත් කොට නැත. එහෙත් ඔහු කියන දෙය සාක්ෂි නැතත් අප පිළිගත යුතුය. පත පොතේ ඇති දේ සාක්ෂි ඇතත් අප පිළිගත යුතු නැත. මෙවැනි බහුභූතවාදියකු ලොව කිසි තැනක සිටිය හැකි ද?

**5 වැනි අභියෝගය-** කවදත් කොතැනත් තිබුණේ එක ම විද්‍යාවක් බව මම පෙන්වා දුන්නෙමි. ඊට හේතුව දැනුම ලබාගැනීමට ඇති එකම මාර්ගය ඉන්ද්‍රිය ගෝචර සාක්ෂි පමණක් වන හෙයිනි. මිනිසාට ඇත්තේ මූලික වශයෙන් එක සමාන ඉන්ද්‍රිය පද්ධතියකි. මිනිසාගේ ලෝකය සහ ස්වභාවධර්මය මූලික වශයෙන් එකකි. කරුණු මෙසේ නම් ස්වභාවධර්මය පිළිබඳ දැනුම ලබා ගැනීමට වෙනත් ක්‍රමයක් තිබිය හැකි ද? නලින් මහතා මෙය පිළිගන්නේ නැත. දැනුම ලබා ගැනීම සඳහා වෙනත් ක්‍රමයක් ඇතොත් පෙන්වා දෙන මෙන් කළ අභියෝගයට පිළිතුරු නැත.

මේ කරුණ ගැන නලින් මහතාට කියන්නට ඇත්තේ චීනයේ තිබුණේ වෙනත් විද්‍යාවක් බවය. එහෙත් චීනයේ තිබූ විද්‍යාව අන් රටවල තිබූ විද්‍යාවට වඩා වෙනස් වන්නේ කෙසේද යන්න ඔහු පෙන්වා දෙන්නේ නැත. විද්වත් ජොෂොප් නිඩහම් මේගැන පවසා තිබෙන දෙය නලින් මහතා තේරුම් ගෙන නැත. නිඩහම් විද්වතාණන් පැවසුවේ චීනයේ විද්‍යාව ලෝකයේ අන් තැන්වල තිබෙන විද්‍යාවම බව ද වෙනසකට තිබුණේ 15 වැනි ශත වර්ෂය වන විට එය විශාල ලෙස දියුණු වී ඉදිරියෙන් සිටි බව ද යන්න ය. වෙනස් විද්‍යාවක් ඔහු චීනයේ දුටුවේ නැත. මා නැවතත් නලින් මහතාට අභියෝග කරන්නේ වෙනත් විද්‍යාවක් කොහේ හෝ තිබුණා නම් තිබේ නම් ප්‍රශ්නයෙන් පැන නොගොස් එය පෙන්වා දෙන මෙන් ය. චීනයේ විද්‍යාව 15 වැනි ශතවර්ෂයෙන් පසුව

යුරෝපයට සාපේක්ෂව ශීඝ්‍රයෙන් දියුණු නොවූයේ එය වෙනස් වූ විද්‍යාවක් නිසා යැයි නලින් මහතා සිතා සිටින බව පෙනේ. තවද මේබව විද්වත් නීඩහම් තහවරු කොට ඇති බවද ඔහු සිතා සිටියි. නලින් මහතාට කිසිවක් තේරුම්ගන්නට බැරිබව මින් ඔප්පුවේ. විද්වත් නීඩහම් තම පරීක්ෂණවලින් සොයාගත්තේ චීනයේ විද්‍යාව සැම විද්‍යාවක් සේ ම ආනුභූතික ක්‍රම මත පදනම් වූ බවය. (see:- Science and civilization in China). තවද චීනයේ විද්‍යාව යුරෝපයේ මෙන් ආක්‍රමණික අභිලාෂ කෙරෙහි නොයෙදුණේ ටාඔස් සහ කොන්ෆියුසියස් ධර්මයන්හි බලපෑම නිසා බව විද්වත් නීඩහම් පවසා ඇත. (නලින් මහතා කුමක් කීවත් චීනයේ ආගම් ගැන ලියන සැම දෙනා මෙන් මාද පාවිච්චි කරන්නේ ටාඔස් යන වචනය ය. වැදගත්කමක් නැති මෙවැනි කරුණුවල නලින් මහතා එල්ලෙන්නේ අදහස්වලින් බංකොලොත් නිසාය). 15 වැනි ශතවර්ෂයට පසුව යුරෝපයේ විද්‍යාව දියුණු වූයේ ඔවුන් ආක්‍රමණික ප්‍රතිපත්තිවලට යොමුවී අන් රටවල් වල ධනය සොරකම් කර ගෙන තම තාක්ෂණයද කර්මාන්ත ද දියුණු කරගත් නිසා ය. ක්‍රිස්තියානි ධර්මය මේ පිළිවෙතට උදව්වූවා මිස විරුද්ධ වූයේ නැත. චීනයේ තිබූ ආගම් මෙවැනි ප්‍රතිපත්තිවලට ඉඩ දුන්නේ නැත. මේ සිදුවීම් සංස්කෘතිය විසින් විද්‍යාව කුමක් සඳහා යොදවාගන්නවාදැයි නිගමනය කරනවා මිස විද්‍යාත්මක ක්‍රමවේදය මත බලපෑම් කිරීමක් නොවන්නේ ය. මේ කරුණ මගේ පෙර ලිපියක විස්තරාත්මකව සඳහන් කොට ඇත. මේ කරුණු වටහා නොගන්නා නලින් මහතා සංස්කෘතියට විද්‍යාත්මක ක්‍රමවේදය වෙනස් කිරීමට හැකියාවක් ඇති බව මා පිළිගත් බව කියයි. විද්‍යාව සහ බුදුදහම විකෘති කරන නලින් මහතාට මා කියූ දෙයක් විකෘති කිරීම කජ්ජක් ද?

**මහාචාර්ය එන්. ඒ. ද එස්. අමරතුංග DSc**

# SAITM පටලැවිල්ල

[ගාමිණී වියන්ගොඩට පිළිතුරු ! 2 කොටස ]

***අජිත් සී. පෙරේරා***

*බූන්දි බ්ලොග් අඩවියේ පළවූ ලිපියකි.*

**රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය** හෝ **වෛද්‍ය සභාව, සයිටම් ආයතනය** ආරම්භ කරන අවස්ථාවේ එයට කිසිදු විරෝධයක් නොදැක්වී යැයි පවසන්නේ බොරුවකි.

**නෙවිල් ප්‍රනාන්දු** විසින් 2008 මාර්තු 31 දා, **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**වෙතින් **සීමා සහිත නෙවිල් ප්‍රනාන්දු පුද්ගලික ආයෝජන සමාගම** වෙත South Asian Institute of Technology and Management (SAITM) පිහිටුවීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි. නෙවිල් ප්‍රනාන්දු ගේ ඉල්ලීම මත මෙහි ප්‍රධාන ආයෝජකයා ලෙස සීමා සහිත නෙවිල් ප්‍රනාන්දු පුද්ගලික ආයෝජන සමාගම යන්න වෙනස් කරමින් පසුව පුද්ගලිකව තමන් වෙත නෙවිල්

ප්‍රනාන්දු විසින් මෙම අනුමැතිය ලබාගෙන ඇත. මෙහිදී අනුමැතිය ලබා ඇත්තේ වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීමට නොවේ. **තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු, වෘත්තීය පුහුණු, සෞඛ්‍ය අධ්‍යාපනය, හෙද** සහ **භාෂා** වැනි පුහුණු පාඨමාලාවන් වෙනුවෙනි.
2009 මැයි මාසයේදී **ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ,** වෛද්‍ය **එච්.එච්.ආර් සමරසිංහ** විසින් ශ්‍රී ලංකාවේ පුද්ගලික උපාධි ප්‍රදාන ආයතනයක් සහ විදේශ වෛද්‍ය විද්‍යාලයක් එක්ව පිරිනමනු ලබන වෛද්‍ය උපාධිය පිළිගැනීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සතුව නීතිමය ප්‍රතිපාදන නොමැති බව දැනුම් දෙන ලදි. විදේශ විශ්ව විද්‍යාලයක වෛද්‍ය උපාධිය ශ්‍රී ලංකාව විසින් පිළිගැනෙන තත්ත්වයක් යටතේ පවා ඉහත "නිවුන් පාඨමාලාවන්" පිළිගත නොහැකි බව ඔහු වැඩි දුරටත් දන්වා තිබේ.

2009 සැප්තැම්බරයේදී **නෙවිල් ප්‍රනාන්දු** විසින් **සයිටම් ආයතනය** (මේ වනවිටත් එහි නම South Asian Institute of Technology and Management ය) එහි 40 දෙනෙකුගෙන් සමන්විත පළමු සිසු කණ්ඩායම වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා ලියා පදිංචි කරන ලදි.

සිය දැනුම් දීම නොතකා රුපියල් ලක්ෂ 65 බැගින් අයකරමින් සිසුන් බඳවාගැනීමට සයිටම් බලධාරීන් කටයුතු කිරීම නිසා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් 2009 ඔක්තෝබරයේදී භාෂා තුනෙන්ම පුවත් පත් දැන්වීම් පළ කරමින් සයිටම්හි වෛද්‍ය උපාධිය පිළිගැනීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සතුව නීතිමය ප්‍රතිපාදන නොමැති බව පෙන්වා දෙන ලදි. ඒ වෛද්‍ය උපාධිය පිරිනැමීමට අදාළ නෛතික හෝ ආයතනික සුදුසුකම් නොමැති ආයතනයක් විසින් ඒ බව වංචනික ලෙස සඟවමින් වෛද්‍ය උපාධිය පිරිනමන බව කියමින් පුද්ගලයන් රවටමින් මුදල් ගසාකෑම වැළැක්වීමටය. එහෙත් නෙවිල් ප්‍රනාන්දු ආරම්භයේ සිටම උත්සාහ කළේ සිය බලගතු දේශපාලන සබඳතා උපයෝගී කරගනිමින් වෛද්‍ය සභාව විසින් මතුකළ කරුණු යටපත් කිරීමටය. ඉන් අනතුරුව හෝ 2010 පෙබරවාරියේදී ද තවත් සිසු කණ්ඩායමක් බඳවාගැනීමට කටයුතු කළේය. මේ නිසා නැවතත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් 2010 මාර්තු භාෂා තුනෙන්ම පුවත්පත් දැන්වීම් පළ කරමින් සයිටම් හි වෛද්‍ය උපාධිය පිළිගැනීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සතුව නීතිමය ප්‍රතිපාදන නොමැති බව පෙන්වා දෙමින් ජනතාව දැනුවත් කරන ලදි.

රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ 2010 වාර්තාව

2010 සැප්තැම්බර් මස 01 දින පැවැත් වූ **රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ** මහා කමිටුවේ තීරණයක් අනුව **සයිටම් ආයතනය** පිළිබඳව විශේෂ වාර්තාවක් සකස් කිරීමට කමිටුවක් පත්කරන ලද අතර එම වාර්තාව දැන් ඔවුන්ගේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර තිබේ. [බලන්න]
එම වාර්තාවේ මෙසේ සඳහන් වේ.
**"4.1 ආයෝජන මණ්ඩලයට පටහැනි බව**

මැතක් වනතුරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව ඇතුළු සමස්ත ජනතාවම විශ්වාස කරනු ලැබුයේ මාලඹේ පිහිටි පෞද්ගලික වෛද්‍ය ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පූර්ණ අනුමැතිය යටතේ පිහිටුවා ඇති ආයතනයක් බවය. නමුත් මෙම සියළු කාණ්ඩ මවිතයට පත්කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ලිඛිතව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට දැනුම් දී ඇත්තේ තම ආයතනය හරහා මාලඹේ අධ්‍යාපන ආයතනයට වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීමට කිසිදු අනුමැතියක් ලබා දී නොමැති බවයි.

මේ අනුව පෙනී යන්නේ මෙම මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන හෝ වෛද්‍ය සේවාවේ ප්‍රමිතීන් හෝ රටේ ආර්ථිකය පිළිබඳව තීරණ ගන්නා කිසිදු ආයතනයකින් අනුමැතිය ලබා නොමැති ව්‍යාජ ආයතනයක් බවයි.

**4.2** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවට පටහැනි බව

ආයතනයක් වනුයේ එය මව් විශ්ව විද්‍යාලය පිහිටි රටේ උසස් අධ්‍යාපනය පිළිබඳ බලතල සහිත ආයතනයෙන් අනුමැතිය ලබා ඇත් නම් පමණි. නිෂ්නිනොව්ගොරොඩ් විශ්ව විද්‍යාලය ලබාදෙන වෛද්‍ය උපාධිය රුසියානු වෛද්‍ය සභාව මගින් පිළිගනු ලැබුවද කොටසක් රුසියාවේදී හා ඉතිරි කොටස ශ්‍රී ලංකාවේදී අධ්‍යාපන ලබාදෙන පාඨමාලාවට රුසියානු වෛද්‍ය සභා අනුමැතිය නොමැත. මෙම සියළු කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ මෙම ආයතනය වෛද්‍ය විද්‍යාලයක් මුවාවෙන් සිදු කරන මුල්‍ය වංචාවක් බවය."

***-සයිටම් පිළිබඳ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ වාර්තාව 2010***

2011 පෙබරවාරියේදී දී **සයිටම් ආයතනය** සිය නම South Asian Institute of විශ්ව විද්‍යාල පනතේ අංක **21** සිට **25A** දක්වා වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව යටතේ පවතින ආයතනවලින් කිසිදු ගණයකට මෙම ආයතනය අයත් නොවේ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව පවසන ආකාරයට මෙය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවතින ශ්‍රමිකයන් පුහුණු කිරීමේ ආයතනයක් ලෙස පිහිටුවා ඇති නිසා මෙම ආයතනය අධීක්ෂණය කිරීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවට බලතල නොමැත.

**4.3** ශ්‍රී ලංකා වෛද්‍ය ආඥා පනතට පටහැනි බව

මාලඹේ පිහිටි පෞද්ගලික වෛද්‍ය ආයතනය ඉහත සඳහන් කළ ආකාරයේ නිවුන් පාඨමාලාවක් ලෙස ආරම්භ කර ඇති අතර මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මෙම ආයතනය ප්‍රතික්ෂේප කර ඇත. මේ බව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ලිඛිතව එම ආයතන ප්‍රධානීන්ට හා භාෂා තුනෙන්ම පුවත්පත් දැන්වීම් හරහා මහජනතාවට දැනුම් දී ඇත. එම නිසා දැනට ක්‍රියාත්මක වන මාලඹේ පෞද්ගලික වෛද්‍ය ආයතනය ශ්‍රී ලංකා වෛද්‍ය සභා අනුමැතිය නොලත් ආයතනයකි. නමුත් පුදුමයට කරුණ වනුයේ මෙවන් පසුබිමක පවා එම ආයතනය එක් සිසුවෙකුගෙන් රුපියල් ලක්ෂ **65**ක් බැගින් අයකරමින් දිගින් දිගටම සිසුන් බඳවා ගැනීමේ කටයුතුවල නිරත වීමය.

**4.4** රුසියානු වෛද්‍ය සභාවේ අනුමැතිය නොමැති බව

ඕනෑම රටක විශ්ව විද්‍යාලයකට පමණක් ස්වකීය කැමැත්ත අනුව තම ආයතනයේ ශාඛා වෙනත් රටවල පිහිටුවීමට නීතිමය අවස්ථාවක් නොමැත. එම ශාඛාව පිළිගත් අධ්‍යාපන Technology and

Medicine ලෙස වෙනස් කරයි. මේ වනවිට ද වෛද්‍ය අධ්‍යාපනය සඳහා සිසු කණ්ඩායම් ගණනාවක් බඳවාගෙන පාඨමාලා ආරම්භ කර තිබුණි. 2011 දක්වා එහි ලියාපදිංචි වී වෛද්‍ය අධ්‍යාපනය ලැබූවන් ලියාපදිංචි වී ඇත්තේ South Asian Institute of Technology and Management යන ආයතන නාමය යටතේය. **වෛද්‍ය සභාව** සහ **රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය** විසින් මෙම ආයතනයේ යෝග්‍යතාව ප්‍රශ්න කිරීමත් සමගම **නෙවිල් ප්‍රනාන්දු** විවිධ දඟංගැට දමමින් එම ප්‍රශ්න යටපත් කරන්නට උත්සාහ දැරූ බව පැහැදිලිය. **මහින්ද රාජපක්ෂ**ගේ සිට විවිධ බලගතු දේශපාලකයන්ගේ මැතිවරණ අරමුදල් වලට මිලියන ගණන් පුදමින් ද ඔවුන්ගේ දරුවන්ට සහ ඥාතීන්ට සයිටම් ආයතනය තුළ වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ලබා දෙමින් ද මෙම ආයතනය පිටුපස ශක්තිමත් මාෆියාවක් ගොඩනගා ගන්නට නෙවිල් ප්‍රනාන්දු සමත් වී තිබේ.

රජයේ වෛද්‍ය නිලධාරි සංගමය හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සයිටම් ආයතනය වෙත එහි ආරම්භක අවස්ථාවේදී විරෝධය පළ නොකළේ යැයි හිතාමතාම බොරු කියන බව පැහැදිලිය. මෙම බොරුව තුළින් ගොඩනැගීමට උත්සාහ දරන තර්කය වන්නේ රජයේ වෛද්‍ය නිලධාරි සංගමය හෝ වෛද්‍ය සභාවේ රාජපක්ෂ හිතවාදින් බවත් ඒ හේතුවෙන් ඔවුන් එදා විරෝධය පළ නොකළ බවත් අද ඔවුන් විරෝධය පළ කරන්නේ ඔවුන්ගේ සදාදරණීය යහපාලනයට එරෙහිව දේශපාලන කුමන්ත්‍රණයක් ලෙස බවත් ප්‍රචාරය කරමින් පුද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහි සමස්ත අරගලය ජනතාව හමුවේ හෑල්ලු කිරීමටය.

මෙම ආයතනයේ වෛද්‍ය පාඨමාලාව සඳහා රුපියල් මිලියන 65 සිට 12 දක්වා මුදලක් ගෙවා ඇති සිසුන් සහ ඔවුන්ගේ දෙමව්පියන් මෙම ආයතනය සම්බන්ධව වෛද්‍ය සභාව හෝ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය කරන ලද අනතුරු ඇඟවීම්වලින් පසුවත් එකෙකු දෙන්නෙකු හැර සෙස්සන් ඒ පිළිබඳව නිසිලෙස සොයා බලා නැත්තේ මන්ද? මිලියන 12ක් යනු ඔවුන්ට එතරම් කජ්ජක් නොවූ නිසාද? නැතහොත් අවසානයේ දී තමන් **රාජපක්ෂලා, රාජිත සේනාරත්නලා, එස්. බී දිසානායකලා, ලක්ෂ්මන් කිරිඇල්ලලා** හරහා සියල්ල ඉටු කරගෙන තත්ත්වය පාලනය කරන බවට දුන් ප්‍රතිඥාවන් විශ්වාස කළ නිසාද?

සයිටම් සිසුන් සිය ආයතනයේ සහ එහි පාඨමාලාවන්ගේ ප්‍රමිතිය පිළිබඳව රජයේ විශ්ව විද්‍යාලවල සිසුන්ට වඩා උනන්දුවක් දක්වන බැවින් එහි ප්‍රමිතිය වඩාත් උසස්මට්ටමක පැවතීමට එය හේතුවනු ඇතැයි තවත් ප්‍රලාපයක් ගොඩනගයි.

**"....රජයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයා තමන්ට නොමිලේ ලැබෙන නිසා එම අධ්‍යාපනයේ ප්‍රමිතිය ගැන ඇස් වසාගෙන සිටියාට, ලක්ෂ සීයක් පමණ වියදම් කරන සයිටම් ශිෂ්‍යයා තමන්ගේ අධ්‍යාපනය ගැන ඇස් කන් පියාගෙන සිටින්නේ නැත. එබැවින්, ප්‍රමිතිය පිළිබඳව අදාළ ඍජු පාර්ශ්වයේම මැදිහත් වීමක් පෞද්ගලික විශ්ව විද්‍යාලයකදී අපට දැක ගත හැකිය."**

***-අධ්‍යාපනයේ නිදහස සහ සයිටම් පටලැවිල්ල ගාමිණී වියන්ගොඩ (අංක- 7)***

**"රාජ්‍ය අංශයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු මෙන් නොව, තමන් ලබන අධ්‍යාපනයේ ප්‍රමිතිය පිළිබඳව පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයා විශේෂ උනන්දුවක් දක්වයි. එහිදී සයිටම් විශ්ව විද්‍යාලය උදාහරණයට ගනිමින් එහි ශිෂ්‍යයෙකු වැය කරන ලක්ෂ සීයක් හෝ ඊට**

**ආසන්න අති විශාල මුදල් ප්‍රමාණය නිසා, ඒ මුදලේ වටිනාකමට සරිලන අධ්‍යාපනයක් ලබා ගැනීම කෙරෙහි එවැනි ශිෂ්‍යයෙකු ස්වභාවයෙන්ම විශේෂ උනන්දුවක් දක්වන බව පෙන්වා දුනිමි. ලක්ෂ සීයක් යනු සෙල්ලමක් නොවේ. එබැවින්, ප්‍රමිතිය පිළිබඳව සයිටම් ශිෂ්‍යයෙකු වඩාත් සවිඥානක වනු නියතයි."**

***-අධ්‍යාපනයේ නිදහස සහ සයිටම් පටලැවිල්ල ගාමිණී වියන්ගොඩ (අංක- 8)***

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පළ කළ පුවත් පත් දැන්වීම් ගණන් නොගෙන මිලියන ගණන් නෙවිල් ප්‍රනාන්දුගේ වෛද්‍ය විද්‍යාල ජාවාරමට බැර කළවුන් දෙතුන් දෙනෙකු දැන් සයිටම් ආයතනයට එරෙහිව නඩු පවරා ඇත. සයිටම් ආයතනය තමන්ට වංචා කළ බව පවසමින් නිතිය හමුවේ සහ වෙනත් ආයතන හමුවේ පැමිණිලි කළ සිසුන්ගේ ශිෂ්‍ය භාවය අහෝසිකිරීමට කටයුතු කරමින් සයිටම් ආයතනය සිය "ඉහළ ප්‍රමිතිය" රැක ගෙන තිබේ. සයිටම් ආයතනයේ **ප්‍රධාන විධායක නිලධාරියා** විසින් සිය ආයතනයේ ප්‍රමිතිය රැකගැනීමට කොතෙක් කැපවී තිබේදැයි කිව හොත් ඔහු ඒ වෙනුවෙන් සිය මෝටර් රථයටම වෙඩි තබාගැනීමට තරම් පරිත්‍යාගශීලි වී තිබේ.

සයිටම් සිසුන් සහ ඔවුන්ගේ දෙමව්පියන් බහුතරය රුපියල් මිලියන 12ක් ගෙවා ඇත්තේ **ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ** අනුමැතිය තමන්ට ඇතැයි ද **රුසියාවේ නිශ්නි නොව්ගොරොද් රාජ්‍ය වෛද්‍ය ඇකඩමිය** සමග ඒකාබද්ධව (Doctor of Medicine) M.D වෛද්‍ය උපාධිය පිරිනැමීමට කටයුතු කරන බවට ද පවසන ලද බොරු අමු අමුවේ ගිල දමමිනි. පුද්ගලික වෛද්‍ය විද්‍යාලයක් මගින් වෛද්‍ය උපාධියක් පිරිනැමීම යනු විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ එය ලංකාවේදී සාමන්‍යයක් නොවන බැවිනි. එහෙත් "ඉහළ ප්‍රමිතිය" මිලියන ගණන් දී මිලට ගත් සයිටම් සිසුන්ට හෝ ඔවුන්ගේ දෙමව්පියන් බහුතරයකට අඩු තරමින් මෙම ආයතනයේ හෝ එහි පාඨමාලාවන්ගේ අව්‍යාජත්වය තහවුරු කරගැනීමට පවා එතරම් උනන්දුවක් තිබී නැති සෙයකි. නැතහොත් ඔවුන් ද මෙම ආයතනයේ සිදුවන වංචනික සහ දූෂිත ක්‍රියාවලිය ගැන හොඳින්ම දැනුවත්ව අවසානයේදී දේශපාලන බලය යොදාගනිමින් වෛද්‍ය උපාධි සහතිකය මිලට ගැනීමට තමන්ට හැකිවෙතැයි යන විශ්වාසයේ පසුවන්නට ඇත. එහෙයින් මේ අතේ තිබූ දෙය කටේ දාගන්නට මොහොතකට පෙර සියල්ල කඩාකප්පල් කළ **වෛද්‍ය ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව** සහ **අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය** ඇතුළු සමස්ත සිසු පරපුරටත් **රජයේ වෛද්‍ය නිලධාරී සංගමය**ටත් ඔවුන්ගේ දැඩි වෛරය එල්ල වී තිබීම තේරුම්ගත හැකි දෙයකි.


විමසීම්:

*තාරක වරාපිටිය - 226, සයිමන් දියෙස් මාවත, මාදුපිටිය, පානදුර*

*0727 449 599*

*warapitiya@gmail.com*

# කළු ජූලිය,
# වර්ගවාදය හා කසාවත

*හරියටම මීට අවුරුදු 34කට පෙර එනම් 1983 ජූලි මාසයේ මේ රටේ අමනුෂ්‍ය ජාතිවාදී රැළක් විසින් සිදුකළ කුරිරු - අමානුෂික, භයංකර ජුගුප්සාජනක ක්‍රියාවන් තනි නමකින් හැඳින්වෙන්නේ ‘‘කළු ජූලිය‘‘ යනුවෙනි. උතුරේ හමුදා භටයින් 13 දෙනෙකු කොටි සංවිධානය විසින් බිම් බෝම්බයකට හසුකොට ඝාතනය කිරීම වෙනුවෙන් සිය ජීවිත වලින් වන්දි ගෙවීමට සිදු වූයේ මේ රටේ අහිංසක දෙමළ වැසියන් පිරිසකටය. එහෙත් ජාතිවාදී ඝාතකයනට හා ඔවුන් එම අපරාධවලට මෙහෙය වූ දේශපාකයන් පිරිසටත් කහ සහ කාකි වස්ත්‍ර දැරුවන් පිරිසකටත් එම අහංසක දරුවෝ ‘‘කොටිම‘‘ වූහ.*

*කඩසාප්පු කොල්ල කෑමේදී පළායාමට නොහැකි අසරණව සිටි මිනිසුන් අල්ලාගෙන දසවධ දී මරා දමද්දී ඒ දෙස පරපීඩක මානසිකත්වයෙන් බලා සිටිමින් කොල්ලකරුවන් සහ ඝාතකයන් මෙහෙයවූයේ කසාවත් දැරුවකු විසිනි. කිසිම ගුණයක් හෝ වංශයක් නොමැති මොහු වැන්නන් පැවත එන්නේ ක්‍රි.පූ. යුගයේදී දුටුගැමුණු රජු අතින් මැරුම් කෑවේ මිනිසුන් 1 ½ක් පමණක් යැයි කියමින් රජු සැනසූ කසාවත් පරපුරෙන් විය යුතු බවට ලියුම්කරු විශ්වාස කරයි. 1983 ජූලි 18 වනදා කොටුව දුම්රියපොළ ඉදිරිපිට, එම කසාවත් දැරූ පුද්ගලයා මෙහෙයවූ සැහැසිකම් මේ ලියුම්කරු විසින් දැසින්ම දක්නා ලදී. සංඛ්‍යාවෙන් 150-200ක් පමණ තරුණයන් පිරිසක් පමණක් සිටි කොටි සංවිධානය දහස් ගණනකින් පෝෂණය කිරීමට සමත් වූ ප්‍රබම සාධකය මේ කළු ජූලියයි. අද නැවතත් ඥානසාරලා ප්‍රමුඛ කසාවත් කල්ලි විසින් රට තල්ලු කරගෙන යාමට තැත් දරන්නේ මීට අවුරුදු 34කට පෙර ඇරඹි එම භීෂණයේම තවත් ආරම්භයකටද?*

*රටට එරෙහිව ඕනෑම ජඩ ක්‍රියාවක් තුළින් බලයට ඒමට වලිකන 2015දී බලයෙන් ගිලිහී ගිය නඩය එම කසාවත් කල්ලියට ජීව වායුව පිඹිමින් සිටින අතර අස්ගිරි පාර්ශ්වය පැත්තෙන් හමා එන අධිපති ආගම්වාදී සුළහඳ ඊට එක්වෙමින් තිබේ. අරකී කිසිම ගුණයක් නොමැති කසාවත් දරන වංශවත් වහන්සේ විද්‍යුත් මාධ්‍ය තුළින් ‘‘බලා නොසිට වහා නැගිටිනු‘‘ යනුවෙන් මෙම බලවේගවලට අණදෙයි. එනපොට හොඳ නැත. සැබෑ දේශප්‍රේමී පුරවැසි බලවේග හා ආණ්ඩුවද මේවා ඉදිරියේ උටකලී නොවී වහා ප්‍රතික්‍රියා කළ යුතුය.*

එස්. රණතුංග

# මේ “හිරු FM” වහුකුනු රේඩියෝවයි !

හිරු FM රේඩියෝ චැනලය විසින් නිතර විකාශය කරන, සමාජ මානසිකත්වය රෝගී කරවන වැඩසටහන් පිළිබඳව පූර්ව දැනුම්දීම් කිහිපයක් ශ්‍රවණය කිරීමට සිදුවීමේ අමිහිරි අත්දැකීමට ප්‍රතිචාර වශයෙන් කරුණු කිහිපයක් පෙළගැස්වීමට නිමිති කර ගනිමින් ඒවා මෙසේ පහත දක්වමු.

*“ඔබේ නිවසේ වසන සියලු දෙනාට බලපාන සියලු දෝෂ, අනවින, කොඩිවින, හූනියම් අපල-උපද්‍රව දුරු කරන මහා බලගතු පිරිත් සජ්ජායනය අලුයම 3 සිට හිරු FM රේඩියෝ චැනලය ඔස්සේ ඇසෙන්නට සලස්වන්න”*

*“ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින ඔබේ දරුවා ඉහලින් සමත් කරවන මහා ආශිර්වාද බෝධි පූජාව අසවල් හිමියන්ගේ සාහාගිත්වයෙන් පැවැත්වෙන අතර එය ශ්‍රවණය කොට ආනිසංස ලබා ගන්න”*

*“ඔබේ ව්‍යාපාරය වැඩිදියුණු කරවන, නිවාස, වාහනය ආදිය ආරක්ෂා කරන මහා බලගතු අසවල් පිරිත් සජ්ජායනය අසවල් වෙලාවේ සිට ඇසෙන්නට සලස්වන්න”*

*“දියවැඩියාව නිට්ටාවටම සුව කරන අසවල් වෙද මහතාගෙන් අදම ප්‍රතිකාර ලබාගෙන සුවය ලබා ප්‍රත්‍යක්ෂ කර ගන්න”*

*“අසවල් ග්‍රහ මාරුව ඔබට, රටට බලපාන්නේ කෙසේද යන්න අවබෝධ කරගන්න මහාචාර්ය මන්ත්‍රාචාර්ය අසවල් ජෝතිසඥයාගේ විග්‍රහයට සවන් දෙන්න”*

හූනියන් කැපීම, සෙත්කවි, ග්‍රහ-අපල දුරුකිරීම්, ජ්‍යෝතිෂය, ආශිර්වාද පූජා ආදිය යනු, තක්කඩින් හා තමන්හට යම්කිසි බලයක් හෝ “වරමක්” ඇතැයි සිතාගෙන සිටින මානසික රෝගීන් පිරිසක් විසින් (තමන්හට ඇති රෝගය පිලිබඳ වැටහීමක් නොමැතිකම ) පවත්වාගෙන යන ජාවාරමක් බව විචාරශීලී සමාජය හමුවේ හෙළිදරව් වී ඇත. තමන්හට හැකියැයි උදම් ඇනු හපන්කම් කිසිවක් සනාත කල නොහැකිව කට්ටඩින් බොහෝ දෙනෙකු මේවනවිට අනාතවී කිච වී, පච වී, පජාල වී සිටින තත්වයක මේ තක්කඩින් හා හවුලේ හුදී ජනයා ගසා කන ජනමාධ්‍ය කට්ටඩින් හට තිබෙන හොඳම ගුබ්බෑයම මේ හිරු FM චැනලයයි.

මාධ්‍ය ආචාරධර්ම පිලිබඳ සාක්ෂරතාවයක් නොමැති ජනතාවක් සිටින, සාමාන්‍ය මානව ගරුත්වය පිලිබඳ අදහසක් හෝ වගවීමක් නැති බුද්ධි හීන මාධ්‍ය කරුවන් බහුතරයක් ඇති, ආත්ම ගරුත්වය මුදලට යටකළ මාධ්‍ය හිමිකරුවන් පමණක් සිටින අපේ රටේ පුරවැසියන් හට හා මාධ්‍ය සමාජයට ගැලපෙන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ධාරානිපාතය අතර හිරු FM රේඩියෝ චැනලය ඉහලින්ම වැජඹෙන බව ද සහතිකය.

සුමේධ විජේරත්න,
නැදිමාල, දෙහිවල